# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2024 අංක 4 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 ජනවාරි මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 ජනවාරි මස 26 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 12.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2024 අංක 4 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2024 ජනවාරි මස 23 වන දින]

එල්.ඩී.-ඕ. 8/2023

**(70 වන අධිකාරය වූ ) වංචා වැළැක්වීමේ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2024 අංක 4 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 70 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තිය, (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) එහි නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ-

(අ) (අ) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත කොටස ආදේශ කිරීමෙන්:-

"(අ) අදාළ ඔප්පුව හෝ සාධන පත්‍රය ලිඛිත වන්නේ නම් ද එකී ඔප්පුව හෝ සාධන පත්‍රය එකී සැම ලියා අත්සන් කරන්නකු හෝ එකී ලියා අත්සන් කරන්නා විසින් යථා පරිදි බලය පවරනු ලැබූ යම් තැනැත්තකු සහ සාක්ෂිකරුවන් විසින් බලපත්‍රලාභී ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ඉදිරිපිට දී සහ එකවර එකිනෙකා ඉදිරියේ පෙනී සිටිමින් අත්සන් කර ඇත්නම් සහ එකී නොතාරිස්වරයා විසින් සහතික කර ඇත්නම් මිස; සහ";

(ආ) (ආ) වන ඡේදයේ, "යම් ඇඟිල්ලක හෝ පාදයක ඇඟිලි සලකුණ" යන වචන වෙනුවට "යම් ඇඟිල්ලක හෝ පාදයක ඇඟිලි සලකුණ එකී ප්‍රසිද්ධ නොතාරිස්වරයා සහ සාක්ෂිකරුවන් ඉදිරිපිට දී" යන වචන ආදේශ කිරීමෙන්

(3) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) පැවරුම් ඔප්පුවක් සම්බන්ධයෙන් වන විට දී -

(අ) විකුණුම්කරු සහ ගැණුම්කරු යන දෙදෙනාම විසින් (1) වන උපවගන්තිය මගින් නියමකර ඇති ආකාරයට ඔවුන්ගේ අත්සන් සහ මහපට ඇඟිලි සලකුණු තබනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ගැණුම්කරුට පැමිණ ඔප්පුව හෝ සාධනපත්‍රය ලියා අත්සන් කිරීමට නොහැකිවන අවස්ථාවක දී, ඔහු විසින්, තමා වෙනුවෙන් එම ඔප්පුව හෝ සාධනපත්‍රය අත්සන් කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකුට ලිඛිතව බලය පවරනු ලැබිය යුතු අතර, එකී තැනැත්තා (1) වන උපවගන්තියේ දක්වා ඇති නියමවලට අනුකූල විය යුතු ය:

එසේ ම තවදුරටත්, ගැණුම්කරු සංස්ථාපිත මණ්ඩලයක් වන විට දී සහ එකී සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පැමිණ ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කිරීමට නොහැකි වන විට දී, එකී මණ්ඩලය, තමා වෙනුවෙන් එම ඔප්පුවට හෝ සාධන පත්‍රයට අත්සන් තැබීමට වෙනත් යම් තැනැත්තකුට බලය පවරනු ලැබිය හැකි අතර, බලය පවරනු ලැබූ එකී තැනැත්තා (1) වන උපවගන්තියේ දක්වා ඇති නියමවලට අනුකූල විය යුතු ය.

(ආ) ගැණුම්කරු බාලවයස්කරුවකු වේ නම්, ගැණුම්කරුගේ භාරකරු මේ පනතේ කාර්යය සඳහා ගැණුම්කරු වෙනුවෙන් ක්‍රියා කිරීමට ශක්නුතාව ඇති තැනැත්තකු විය යුතු ය.".

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.